**ඒකාබද්ධ සේවා චක්‍රලේඛ ලිපි අංක . 04/93**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
ඒකාබද්ධ සේවා අංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1993 ජූලි මස 30 වෙනි දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දිස්ත්‍රික් ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**<u>කාර්යාල සේවක සේවයේ පුරප්පාඩු</u>**

ඒකාබද්ධ සේවයට අයත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල පවත්නා කාර්යාල සේවක සේවයට අයත් පුරප්පාඩු පිරවීම පිණිස බඳවා ගැනීමේ විභාගයක් පවත්වා ඇති අතර, නව නොබෝ දිනකින් එහි ප්‍රතිඵල නිකුත් වනු ඇත.

02. එහි ප්‍රතිඵල අනුව ඔබ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුල පවත්නා පුරප්පාඩු පිරවීමට අදහස් කරන බැවින්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම යාමෙන් පසු ඇතිවූ පුරප්පාඩු හැර (එම පුරප්පාඩු පුරවනු ලබන්නේ භාණ්ඩාගාර අනුමතිය ලබා තිබුණහොත් පමණි.) ඉතිරි පුරප්පාඩු පහත දක්වෙන ආකෘතිය පරිදි සඳහන් කර එවන්නේ නම් මැනවි. තවද, මෙම පුරප්පාඩු සඳහන් කර එවීමේදී 1993.01.01 දිනට වාර්තා වන පුරප්පාඩු පමණක් ගණන් ගත යුතු අතර, එම පුරප්පාඩු වාර්තා කිරීමේදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/93 අනුව කටයුතු කර ඉන්පසු ඉතිරි වන පුරප්පාඩු පමණක් සැලකිල්ලට ගත යුතුය.

03. 1993.08.20 දිනට ප්‍රථම පුරප්පාඩු විස්තර වාර්තා කළ යුතු අතර, ඉන්පසු එසේ අදාල විස්තර නොඑවන අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල පුරප්පාඩු නැති සේ සළකා කටයුතු කරනු ලැබේ.

අ.කලේ/ඩබ්ලිව්.ඩී.එල්. පෙරේරා)
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ

| කා.සේ.සේ. 111 පන්තිය | අනුමත සංඛ්‍යාව | දනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. කාර්යාල කම්කරු<br>උද්‍යාන කම්කරු<br>අමදින්නා | | | |
| 2. කා.සේ.සේ. 111 "අ"<br>සනීපාරක්ෂක කම්කරු | | | |